මෙම ලිපිය ඉංග්‍රීසි බසින් ඇමරිකාවේදී www.bhikkhuni.net වෙබ් අඩවියෙහි "ප්‍රසන්ටි" නම් සඟරාවේ "ද වොයිස් ඇන්ඩ් ඇක්ටිවිටීස් ඔෆ් ථෙරවාද බුඩිස්ට් විමෙන්" (Summer 2011) නමින් පළවී ඇත. ශ්‍රී ලංකාවේ බුදු දහම පිළිබඳ නොදන්නා අයට කියවීමට ශ්‍රී ලංකාවේ මෙහෙණිවරුන් පිළිබඳ ලිපියක් ලියන ලෙස මහාචාර්ය මෝසික්ගෙන් "ප්‍රසන්ටි" සඟරාවේ කර්තෘවරුන් කරන ලද ඉල්ලීමකට අනුව මෙම ලිපිය රචනා වී ඇති අතර එය සිංහලට නගන ලද්දේ සරිතා රණතුංග සහ චමිලා සොමිරත්න විසිනි.

සුසේන් මෝසික්
ආගම පිළිබඳ සහය මහාචාර්ය, මවුන්ට් හොල්යෝක් කොලේජ්, ඇමරිකා එක්සත් ජනපදය.
ෆුල්බ්‍රයිට් සහ ශ්‍රී ලංකා අධ්‍යාපනය පිළිබඳ ඇමරිකානු ආයතනයේ ශිෂ්‍යත්වලාභියෙකි.

## කල්‍යාණ මිත්‍ර ඇසුරක් : ශ්‍රී ලංකාවේ මෙහෙණිවරු

එය ශ්‍රී ලංකාවේදී උදාවූ උණුසුම සහ සිසිලස කැටි වූ තවත් එක් දවසකි. මම බසයට නැගීමට සූදානම් වුණෙමි. අද දවස වෙන් කෙරුණේ එක්තරා හමුවීමක් වෙනුවෙනි. එහෙත් දැන්නම් මට ඒ ගැන සැබෑ උනන්දුවක් නැත. එය දහදිය පෙරාගෙන දූවිල්ලෙහි වැකෙමින් සැප පහසුවකින් තොරව යා යුතු ගමනකි. සිතෙහි ඇත්තේ නොරිස්සුම් බවකි. එහෙත් මම බසට නගින විටම මා ඉදිරියෙහි ඇති අසුනෙහි මෙහෙණියක හිඳගෙන සිටිනු දුටුවෙමි. මම ඇය අසලින් හිඳගත්තෙමි. අපි එකිනෙකා වෙත මඳ සිනා පෑවෙමු. මගේ නොරිස්සුම පහවිය. මම දැන් කල්‍යාණ මිත්‍ර ඇසුරේ සිටිමි.

තායි විද්වත් භික්ෂුවක් වූ පායුත්තෝ හිමි වරක් අපට පැවසුවේ ¨අධ්‍යාත්මික සගයා යනු විමුක්ති මාර්ගයේ ගමන් ඇරඹීමට උගන්වන, ඉඟි කරන, පෙන්වන, ධෛර්යමත් කරන සහය දෙන සහ මෙහෙයවන¨[1] ඕනෑම පුද්ගලයෙකු බවයි. බෞද්ධ ග්‍රන්ථවලින් කියවෙන්නේද කල්‍යාණ මිත්‍රයා යනු මා අසල වාඩි වී සිටි මෙහෙණිය මෙන් වචනයක්වත් කථා නොකර යමක් ඉගැන්විය හැකි අයෙකු බවයි.[2] ඇයගේ කරුණාව මෙන්ම විනය ගරුකභාවයද බාහිර ස්වරූපයද බුදු දහමින් ඇය ලත් ශික්ෂණය මූර්තිමත් කරන්නට විය. ඇය දැක්මෙන් මම මොහොතින් යථා තත්ත්වයට පත්වූයෙමි. මම බාහිර පරිසරයෙහි අපහසුතා පිළිබඳ මසිතේ වූ නොරිස්සුම පහකරමින්, සැබැවින්ම පීඩාකාරී මෙවැනි බසයකදී පවා සතුට දනවන මානව සබඳතා ඇතිකර ගැනීමේ හැකියාව ඇති කරගනිමින් සිටියෙමි.

## වත්මන් ශ්‍රී ලංකාවේ භික්ෂුනිය

ඕනෑම අයෙකුට ධර්ම මාර්ගයෙහි පුහුණුව ලබන තවත් අයෙකුට කල්‍යාණ මිත්‍රයෙකු විය හැකි නමුත් ශ්‍රී ලාංකිකයන් (වෙනත් බෞද්ධයන් මෙන්) සාම්ප්‍රදායිකව පැවිද්දන් පමණක් නියම කල්‍යාණ මිත්‍රයන් ලෙස සලකන්නේ පැවිද්දන් විසින් ලබාදෙන පුළුල් බෞද්ධ අධ්‍යාපනය නිසාය. කෙසේ වෙතත්, මෑතක් වනතුරු ශ්‍රී ලාංකික ථෙරවාද භික්ෂු සංඝයා සමන්විත වූයේ භික්ෂූන් නොඑසේනම් පූර්ණ උපසම්පදාව ලත් පැවිද්දන්ගෙන් පමණි. ශත වර්ෂ ගණනාවක සිට භික්ෂුනීන් එනම් පූර්ණ උපසම්පදාව ලත් මෙහෙණිවරුන් දක්නට නොලැබිණි. කාන්තාව අද මෙන්ම අතීතයේද මවක, මිතුරියක, ගුරුවරියක සහ ගිහි දායිකාවක වශයෙන් ඔවුන්ගේ භූමිකාවල සැබෑ ලෙසම කලණ

මිතුරියක ලෙස කටයුතු කර ඇතත් එකල නියම කල්‍යාණ මිත්‍රයා ලෙස සළකනු ලැබ ඇත්තේ උපසම්පදා භික්ෂුව පමණි. එහෙත් අද වන විට එම තත්වය වෙනස් වී ඇත. 1990 අග භාගයේ සිට ශ්‍රී ලංකාවේ උපසම්පදා භික්ෂු භික්ෂුනී යන දෙපිරිසම සිටිති.

සැකෙවින් ගත් කල එය සිදු වූයේ මෙසේය. ශ්‍රී ලංකාවේ භික්ෂුනී උපසම්පදාව මුලින්ම පිහිටුවන ලද්දේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේදීය. යුදමය කාලවලදී අභාවයට පත් වන තුරු භික්ෂු උපසම්පදාවත්, භික්ෂුනී උපසම්පදාවත් දසවන ශතවර්ෂයේ අග භාගය සහ එකොළොස්වන ශත වර්ෂයේ මුල් භාගය දක්වා සාර්ථකව ක්‍රියාත්මක විය. ඉන්පසු භික්ෂු උපසම්පදාව බුරුම සහ තායිලන්ත භික්ෂූන්ගේ අනුගහයෙන් යළි යළි පිහිටුවනු ලැබුවද භික්ෂුනී උපසම්පදාව සම්බන්ධයෙන් අවාසනාවකට මෙන් එවැන්නක් සිදු වූයේ නැත. කල් ගත වන විට 20 වන ශත වර්ෂයේදී ප්‍රගතිශීලී ශ්‍රී ලාංකික බෞද්ධයන් භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීමට පක්ෂව කතාබහ ඇරඹූ අතර ඒ වන විට උපසම්පදා විනය කර්මය පැවැත්වීමට සුදුසුකම් ලැබූ මහායාන භික්ෂුනීන් මිස ඒ සඳහා සුදුසු ථෙරවාද භික්ෂුනීන් ලොව කිසි තැනක වැඩසිටියේ නැත. ආසන්න වශයෙන් සියවස් දහයක් පමණ ලංකාවේ භික්ෂුනී ශාසනය නොපැවතුණි. ප්‍රගතිශීලී ශ්‍රී ලාංකික භික්ෂූන් දකුණු කොරියානු භික්ෂූන් සහ භික්ෂුනීන් හා එක්ව 1996 දීද තායිවාන් භික්ෂූන්, භික්ෂුනීන් සහ තවත් අය හා එක්ව 1998 දීද ඉන්දියාවේ දී ජාත්‍යන්තර භික්ෂුනී උපසම්පදා උත්සව දෙකක් පැවැත්වීම බෞද්ධයන්ගේ නොමද සතුටට හේතු වූ කරුණකි. මෙම උපසම්පදා උත්සවයන්හිදී ශ්‍රී ලාංකික දසසිල් මාතාවෝ 30කට අධික ප්‍රමාණයක් ථෙරවාද භික්ෂුනීන් ලෙස උපසම්පදාව ලැබූහ. 1998 සිට මේ දක්වා නියමිත කාල සීමාවකට වරක් ශ්‍රී ලංකාවේ දඹුල්ල, දෙකඳුවල හා නැව්ගල භික්ෂුනී උපසම්පදා විනයකර්මය සිදු කර ඇත. (ඉදිරියේදී බොහෝදුරට මෙම වාරසංඛ්‍යාව වැඩිවනු ඇත.) භික්ෂුනීන් ඔවුන්ට උපසම්පදාව ලබාදුන් ආරාමයට අනුව හැඳින්වීමේ නැඹුරුවක් පවතින නිසා විශේෂ භික්ෂුනී නිකායන් හෙවත් ආරම්භක සම්ප්‍රදායන් මතුවීමට පටන ගැනිණි. මෙය දිගු කලක සිට භික්ෂූන් සම්බන්ධයෙන්ද සිදු වන්නකි.

ශ්‍රී ලංකාවේ භික්ෂුනී උපසම්පදාව තවමත් ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින්නකි. වර්තමානය වන විට උපසම්පදා භික්ෂුනීහු 1000 ක් පමණද උපසම්පදාව සඳහා පුහුණුව ලබන සාමණේරවරියන් හෙවත් නවක මෙහෙනින් වහන්සේලා 1000 ක් පමණද සිටිති. ඊට අමතරව උපසම්පදාව ලැබීමට උනන්දු නොවී සාමණේර දස සීලයම සමාදන් වී සිටින දසසිල් මාතාවෝ අවම වශයෙන් 2000ක් පමණ සිටිති.[3] මොවුහු 1905 දී, එනම් භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීමට හැකියාවක් නොතිබුණු කාලයේ පිහිටුවන ලද දසසිල් මාතාවන් නමැති සම්ප්‍රදායට අයත් වෙති. 1990 දශකයේ අග භාගයේ සිට බොහෝ දසසිල් මාතාවන් උපසම්පදාව ලැබුවද එසේ නොකළ බොහෝ දෙනෙක්ද සිටිති. එම නිසා අද වන විට සාමණේරවරියන් ඇතුළු උපසම්පදා භික්ෂුනීන් සහ දසසිල් මාතාවන් ලෙස අංශ දෙකක් පවතින අතර ඒ දෙයංශයටම අයත් මෙහෙණිවරු ඔවුන්ගේ ප්‍රජාවට වැදගත් සේවයක් ඉටු කරති.

පළමුවෙන් උපසම්පදා කරනු ලැබූ කාන්තාවන් තෝරාගන්නා ලද්දේ ඒ වන විට ඉහළ තත්වයක සිටි දසසිල් මාතාවන් අතරිනි. මොවුන්ගේ බොහෝ දෙනෙක් උපසම්පදාව ලැබීමට පෙර දසසිල් මාතාවන් ලෙස දශක කිහිපයක් ගත කළ අය වෙති. එහෙත් අද වන විට කාන්තාවෝ බොහෝ දෙනෙක් තරුණ වියේදීම භික්ෂුනීන් ලෙස පැවිද්දට ඇතුළු වෙති. ශ්‍රී ලංකාවේ භික්ෂුනී ශාසනය යළි

පිහිටුවීම පිළිබඳව කෙරෙන මගේ පර්යේෂණයේදී නව යොවුන් වියේදී එකවර පැවිද්දට ඇතුළු වූ සොහොයුරියන් සහ /හෝ ඥාති සොහොයුරියන් මට හමුවී ඇත. ඔවුන්ගේ අදහසට අනුව තරුණ කාලයේ කය සහ මනස වඩාත් නම්‍යශීලි බැවින් සහ දැඩි ආරම්භක පුහුණුවට සහ අධ්‍යාපනයට පහසුවෙන් අනුගත විය හැකි බැවින් මැදිවියේ හෝ වයස්ගත කාන්තාවන්ට වඩා පහසුවෙන් ඔවුන්ට ඉගෙනගත හැකිය. මෙම තරුණ භික්ෂුණී පරපුර ශ්‍රී ලංකාවේ ශාසනික වර්ධනයේදී සහ ව්‍යාප්තියේදී සුවිශේෂී වැදගත් කමක් දරන පිරිසක් ලෙස සලකනු ලැබේ. මේ සියල්ලෙන්ම ධ්වනිත වන්නේ ශ්‍රී ලංකාවේ භික්ෂුණී උපසම්පදාවට නිශ්චිත වයස් සීමාවක් නොමැති බවයි. පනස් වියෙහි සිටින මාද කිහිප විටකදීම පැවිදි වීම සඳහා පොළඹවනු ලැබ ඇත්තෙමි.

පෙර දසසිල් මාතාවක්ව සිට උපසම්පදාව ලැබූ භික්ෂුණියක හමුවන ඕනෑම විටෙක මම ඇගේ ජීවිතයේ දැන් ඇතිවී තිබෙන වෙනස ගැන ප්‍රශ්න කරමි. එම භික්ෂුණීන් සෑම විටම පිළිතුරු දීම අරඹන්නේ ඔවුන් සමාදන්ව සිටින ශික්ෂා පද සංඛ්‍යාවේ විශාලත්වය ප්‍රධානතම වෙනස බව පැහැදිලි කරමිනි. දසසිල් මාතාවන් ශික්ෂාපද 10 ක් සමාදන්ව සිටින අතර භික්ෂුණීහු ශික්ෂාපද 311 ක් සමාදන්ව සිටිති. ශික්ෂාපද 10කට වඩා ශික්ෂාපද 311ක් සමාදන්වීම තරමක් දුෂ්කර බව දැනදැනම උපසම්පදාවට ඇතුළු වුවත් ශික්ෂාපද ගණනින් වැඩිවීම පිළිබඳව ඔවුහු නිතැතින්ම කෘතඥතාව පළ කරති. මන්දයත් ආචාර සම්පන්න නොවන චර්යාවන්ගෙන් වැළකීම පිණිස ඔවුන්ගේ කය සහ මනස හික්මවීමට ශික්ෂාපද උපකාර වන බැවිනි. ජ්‍යෙෂ්ඨ භික්ෂුණියක පැවසූ පරිදි මෙම ශික්ෂාපද මගින් ඇයව වරදට පොළඹවිය හැකි ඇගේම මනසින් ඇයව ආරක්ෂා කරනු ලබයි. ඇය මෙන්ම ඇය වැනි භික්ෂුණීහුද ආචාර සම්පන්න නොවන චර්යාවන්ගේ සමාජීය මෙන්ම කර්මීය ප්‍රතිවිපාක අවධාරණය කරති. මෙම භික්ෂුණීන්ගේ දෘෂ්ටිකෝණයට අනුව වැරදි හැසිරීම් සඳහා ඇති ඉඩ කඩ සීමා කිරීම, ශික්ෂා පද පිළිබඳ නිරන්තර සිහිය පිහිටුවීම මගින් ඔවුන්ගේ කය සහ මනස හික්මවීම, ඇතැම් විට වඩාත් වැදගත් කරුණ ලෙස නිවන් මගින් ඈත් කරවන ඕනෑම දෙයකට පවතින දැඩි ආශාව අත්හැරීමට ඔවුන්ට ඉගැන්වීම ආදී බොහෝ ක්‍රම මගින් මෙම ශික්ෂාපද ඔවුන්ව මෙම දුර්විපාකයන්ගෙන් ආරක්ෂා කරයි.

ශ්‍රී ලංකාවෙන් පිටත සිටින මගේ බොහෝ පාඨකයෝ ශ්‍රී ලාංකික භික්ෂුණීන් ආචාර සම්පන්න නොවන චර්යාවන්ගේ කර්ම විපාක පිළිබඳ මේ තරම් අවධානය දැක්වීම පිළිබඳව මවිත වෙති. කරුණාකර, ශ්‍රී ලාංකික බෞද්ධයන් කර්මය ඉතා බරපතළ ලෙස සළකන බව සිහි තබා ගන්න. තවද ඔවුහු අවක්‍රියාවන්ගෙන් වැළකීමට උපකාරී වන ලැජ්ජාව (සහ බිය) පරම ගුණාංග ලෙස සළකති. පුළුල්ව ගත්විට මෙය බෞද්ධ ධර්ම ග්‍රන්ථයන්හි එන කේන්ද්‍රීය අදහසක්ද වන නමුත් බෞද්ධ නොවන රටවල ජීවත්වන ඇතැම් නූතන බෞද්ධයන්ට මෙය නුහුරු දෙයක් ලෙස දැනෙන්නට පුළුවන. සැකෙවින් ගත් කල ශ්‍රී ලාංකික භික්ෂුණීහු ඔවුන්ගේ ශික්ෂාපද කෙරෙහි අසීමිත කෘතඥතාව පළ කරති. මෙම ලිපිය කියවන පාඨකයින්ට පැවසීමට ඇත්තේ කුමක්දැයි මම එක්තරා ජ්‍යෙෂ්ඨ භික්ෂුණියකගෙන් ඇසූ විට ඇය පැවසුයේ, ඇය මෙන්ම මින් පෙර සිටි දසසිල් මාතාවන්ද, "උසස් සීලයක් පිළිබඳ පිපාසයෙන් සිටියා වාසනාවකට 1998 දී අපට ඒක ලැබුණා. දැන් ලංකාවේ භික්ෂුණීන් ඉතාමත් සතුටින් ඉන්නවා", යනුවෙනි.

දස සිල් මාතාවන් ලෙස ගත කළ දිවිය ඔවුන්ගේ වත්මන් දිවිය හා සසඳන විට උපසම්පදා භික්ෂුනීන් අවධානයට ලක්කරන එකම කරුණ ශික්ෂාපද පමණක් නොවේ. දැන් ඔවුන් භික්ෂු සංඝයාගේ කොටසක් බවද ඔවුහු අවධාරණය කරති. (දසසිල් මාතාවන් භික්ෂු සංඝයාගේ කොටසක් ලෙස නොසැලකෙන අතර ඔවුහු සාමනේරිවරියන් හා ගිහි පුද්ගලයන් අතර පිහිටි එක්තරා ආගමික තලයකට අයත් වෙති). එමෙන්ම මේ වනවිට උපසම්පදා භික්ෂුනීන් භික්ෂූන් විසින් ඉටු කරනු ලබන සියලුම ආගමික චාරිත්‍ර ඉටු කිරීමේ හැකියාවෙන් යුක්තය. උදාහරණයක් ලෙස දසසිල් මාතාවන් මෙන් නොව භික්ෂුනීහු නිතිපතා අටපිරිකර ලබති. ගිහි බෞද්ධයෝ භික්ෂුනීන්ටද සාංඝික දානයන්ට සහභාගී වීමට ආරාධනා කරති. භික්ෂුනීන්ද මා සමග පවසා ඇත්තේ ගිහි සමාජය ඔවුන්ගෙන් ඉල්ලා සිටින ඕනෑම චාරිත්‍රයක් වඩාත් හොඳින් ඉටුකර දිය හැකි බවයි.

ඇතැම් විට දස සිල් මාතාවක හා භික්ෂුනියක අතර වෙනස බැලු බැල්මට හඳුනාගත හැක්කේ ඔවුන්ගේ සිවුරෙනි. දසසිල් මාතාවන් හා භික්ෂුනීන් යන දෙපිරිසම සාම්ප්‍රදායික කහ පැහැති ථේරවාද සිවුර දැරුවද භික්ෂුනීන්ගේ හා දසසිල් මාතාවන්ගේ සිවුරෙහි සියුම් වෙනසක් ඇත. භික්ෂුනීහු භික්ෂූන් මෙන් කපා මසන ලද සිවුරක් දරති. එනම් සිවුර කුඹුරක ලියැදි මෙන් දිස්වේ. දසසිල් මාතාවන්ගේ සිවුර නොකපන ලද තනි ඝන රෙද්දකින් නිමවා ඇත.

කෙසේ වෙතත් ඒ ගැන අවධානයෙන් බලන දෑසකට මිස නුපුහුණු දෑසකට ඒ වෙනස හඳුනාගත නොහැකිය. ශ්‍රී ලාංකිකයන්ට භික්ෂුනී උපසම්පදාව ඔවුන්ගේ රටේ යළි පිහිටුවා ඇති බවට කිසිදු හැඟීමක් නොදැනෙන්ට එයද එක හේතුවක් විය හැකිය. එය දන්නා අය පවා භික්ෂුනීන් හා දසසිල් මාතාවන් වෙන්කර ආමන්ත්‍රණය කිරීමට අපොහොසත් වෙති. එබැවින් සංඝයා ඇමතීමට විශේෂ ගෞරවාන්විත වචන මාලාවක් පවතින රටක මෙය වැදගත් ප්‍රශ්නයක් වන අතර භික්ෂුනීන් වහන්සේලාට ආමන්ත්‍රණය කිරීම පිළිබඳ නිරන්තර පැටලිලි සහගත බවක් ඇත. ඇතැම් භික්ෂුනී ආරාමවල ගිහි දායකයන් පවා භික්ෂුනීන් හා දසසිල් මාතාවන් අතර වෙනස හෝ එබඳු වෙනසක් පවතින බව හෝ නොදන්නා බව දැන ගැනීමෙන් මම පුදුමයට පත් වුණෙමි. මෙම ගිහි දායකයන් දන්නා එකම කරුණ වූයේ ඔවුන්ගේ මෙහෙණිවරුන් ඉතාම හොඳ එනම් සිල්වත්, කරුණාවන්ත සහ හොඳින් ධර්මය කියා දිය හැකි අය බවයි.

**වත්මන් ශ්‍රී ලංකාවේ දසසිල් මාතාව**

ඔවුන්ගේ ආරාමවල ආගමික වැඩසටහන් පැවැත්වීම (භාවනා වැඩසටහන් ඇතුළුව), ගිහි බෞද්ධයින් සඳහා චාරිත්‍ර ඉටු කිරීම, විවිධ සමාජ කටයුතුවලට සම්බන්ධ වීම ආදිය මගින් භික්ෂුනීන් මෙන්ම දසසිල් මාතාවෝද ඔවුන්ගේ ප්‍රජාවට විශාල දායකත්වයක් සපයති. අපි භික්ෂුනී උපසම්පදාව යළි පිහිට වීමට පක්ෂ වුවද ඒ අතරම ශ්‍රී ලාංකික දසසිල් මාතාවන්ගේ ආගමික හා සමාජ සේවය පිළිබඳව නිරන්තරයෙන් ගෞරවය හා කෘතඥතාව පළ කරමු. එය අග්නිදිග ආසියාවේ සිදුවූ පරිදිම උපසම්පදාව ලබාගත නොහැකි තත්වයක් තුළ ඊට විකල්ප වශයෙන් දසසිල් මාතාවන්ගේ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ වර්ධනය කළ ථෙරවාද බෞද්ධ කාන්තාවන්ගේ අප්‍රතිහත ධෛර්යය හා කැපවීම වෙනුවෙන් කරන උපහාරයක්ද වන්නේය.

නමුත් දැන් ශ්‍රී ලංකාවේ භික්ෂුනී උපසම්පදාව ඇතත් සමහර දසසිල් මාතාවන් භික්ෂුනීන් බවට පත් නොවන්නේ ඇයි? සමහර ශ්‍රී ලාංකික තරුණියන් හා කාන්තාවන් භික්ෂුනීන් වීම වෙනුවට දස සිල් මාතාවන් වීමටම තීරණය කරන්නේ ඇයි?

මා සිතන පරිදි ඊට හේතු සාධක එකිනෙකට වෙනස් මෙන්ම සංකීර්ණද වේ. අලුතින් ඇති කරන ලද භික්ෂුනී උපසම්පදාව නීත්‍යනුකූල නොවනු ඇතැයි මේ කාන්තාවන් විශ්වාස කිරීම මීට හේතුව විය හැකි යැයි මතු පිටින් බලන විට ඔබට පැවසිය හැකිය. ඔවුන් එසේ විශ්වාස කරන්නේ 1996 හා 1998 පැවැත්වූ ශ්‍රී ලාංකික භික්ෂුනී උපසම්පදා යලි ලබාදුන් ජාත්‍යන්තර උපසම්පදා උත්සවවලට ථෙරවාද බුදු දහමට වඩා මහායාන සම්ප්‍රදාය අනුගමනය කළ දකුණු කොරියානු සහ තායිවාන් භික්ෂූන් සහභාගි වූ නිසාය. එම නිසා ඇතැම් දසසිල් මාතාවන් විශ්වාස කරන්නේ ඕනෑම ශ්‍රී ලාංකික භික්ෂුනියක ථෙරවාද භික්ෂුනියකට වඩා මහායාන භික්ෂුනියක වන බවයි. මෙය ශ්‍රී ලාංකීය භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීම ප්‍රතික්ෂේප කරන අය නගන පොදු තර්කයකි. මම එය ලංකාවේදී බෞද්ධ භික්ෂූන්, ගිහි දායක දායිකාවන්, දසසිල් මාතාවන් ආදි විවිධ අය වෙතින් අසා ඇත්තෙමි. භික්ෂුනීන්ට භික්ෂූන් ඇතුළු විවිධ පාර්ශවයන්ගේ සහය හිමි වුවත් ලංකාවේ ඔවුන්ගේ උපසම්පදාව මතභේදයට ලක්ව ඇත.

ශ්‍රී ලංකාවේ භික්ෂුනීහු නියත වශයෙන්ම ථේරවාද භික්ෂුනීන් මිස මහායාන භික්ෂුනීහු නොවෙති. ඔවුන් ථෙරවාද පාලි විනය අනුගමනය කරන අතර ආරම්භක පුහුණුවෙන් කෙරෙන්නේ හා උගන්වන්නේද ථෙරවාද බුද්ධ ධර්මයයි. ශ්‍රී ලංකාවේ භික්ෂුනියට මහායාන සම්භවයක් ඇති බවට නගන චෝදනාව පිළිබඳ විවාදය පිළිබඳ වැඩි දුර දැන ගැනීමට අවශ්‍ය පාඨකයා බෝධි භික්ෂුව විසින් ඒ මාතෘකාව යටතේ ලියා ඇති විශිෂ්ට රචනය වෙත යොමු විය යුතුය.[4] බෝධි භික්ෂුවගේ ලිපිය කියවීමට ඉඩකඩ ඇති නිසා සහ දස සිල් මාතාවන් දසසිල් මාතාවන් ලෙසම සිටීමට එය ඉතා වැදගත්ම හෝ එකම හේතුව නොවන නිසා මම ඒ පිළිබඳ වැඩි විස්තර නොදක්වමි.

එසේ නම් මෙම දසසිල් මාතාවන් භික්ෂුනී පැවිද්ද ප්‍රතික්ෂේප කරන්නේ ඇයි? ප්‍රථමයෙන්ම, තම නිකාය වර්ධනයට ජීවිතයෙන් වසර ගණනක් කැප කළ දසසිල් මාතාවන් තුළ (විශේෂයෙන්ම මෙම නිකායේ පරිපාලනමය තත්ත්වයේ සිටි අය) ඔවුන්ගේ නිකායට විශාල වශයෙන් පක්ෂපාතීත්වයක් ඇතිවෙතැයි සිතා ගැනීම අපහසු නොවේ.

දෙවනුව සහ ඇතැම් විට වඩා වැදගත් ලෙස, ශ්‍රී ලංකාව යනු දෙමාපියන්, ගුරුවරුන්, භික්ෂූන්, මෙහෙණිවරුන් හෝ ඕනෑම ආකාරයක වැඩිහිටියන් යනාදි තමන්ට වඩා ඉහළින් සිටින අයට පුරුද්දක් ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් ගරුත්වය පෙන්වන මිනිසුන් සිටින සමාජයකි. මෙහෙණිවරු දෙදෙනෙකු මුණගැසුණු විට ජ්‍යෙෂ්ඨ මෙහෙණියට ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු මෙහෙණිය ගෞරවය පුද කරයි. තරුණ දසසිල් මාතාවන් භික්ෂුනී උපසම්පදාව නොලබා සිටීමට එය එක් පොදු හේතුවක් වන්නේ ඔවුන්ගේ ගුරු දසසිල් මාතාවන් භික්ෂුනී උපසම්පදාවට අයත් දැඩි පුහුණුව සහ ශික්ෂාපද දරා සිටීමට නොහැකි තරම් වයස් ගත වීම නිසා විය හැකිය. පූර්ණ උපසම්පදාව ලබා සිටින නිසා සහ දසසිල් මාතාව එසේ නොවන නිසා න්‍යායානුකූලව භික්ෂුනිය දසසිල් මාතාවට වඩා ජ්‍යෙෂ්ඨ වෙයි. එමනිසා දසසිල් මාතාවක් භික්ෂුනියකට ආචාර කරන විට ඇය භික්ෂුනියට හිස නැමිය යුතුය. බොහෝ

දසසිල් මාතාවන් විශ්වාස කරන පරිදි ගුරු දස සිල් මතාවන් පෙර තම ශිෂ්‍යාවකව සිටි භික්ෂුනියකට හිස නවන තත්වයකට පත් කරවීම තම ගුරු දසසිල් මාතාවට කරන අගෞරවයකි. එසේම ඉඳහිට සමහර ගුරු දස සිල් මාතාවන් විසින් තමන්ට භික්ෂුනී උපසම්පදාව ලද නොහැකි හෙයින් තම ශිෂ්‍ය දස සිල් මාතාවන්ද උපසම්පදාව ලැබීමෙන් වළක්වනු ලැබීම මනුෂ්‍ය සිතවිලිවල ස්වභාවයට අනුකූලය. දස සිල් ආරාමවලට සම්බන්ධ සමහර භික්ෂූහුද ඉඳහිට දස සිල් මාතාවන් උපසම්පදා ලැබීමෙන් වළක්වනු දැකිය හැකියි.

එමෙන්ම දශක කිහිපයකට පෙර පැවිදි වූ දසසිල් මාතාවන්ට උපසම්පදාව ලැබුණු විට එකවරම ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු භික්ෂුනියක වීමට සිදුවීම නිසා ඇතැම් ජ්‍යෙෂ්ඨ දසසිල් මාතාවෝ අපහසුතාවට පත්ව සිටිති. ජ්‍යෙෂ්ඨත්වය ගණනය කරනු ලබන්නේ උපසම්පදාවට ඇතුළත් වූ දා සිට ගතවන වසර ගණන අනුව නමුත් භික්ෂුනියක දස සිල් මාතාවක්ව සිටි කාලය එහිදී සලකනු නොලැබේ. එනම් ජිවිත කාලයම දසසිල් මාතාවක්ව සිටි මෙහෙණියකට ඇය උපසම්පදාව ලබාගැනීමට තීරණය කිරීමට පෙර උපසම්පදාව ලද වයසින් අඩු භික්ෂුනීන්ට වැඳීමට සිදුවේ. තව දුරටත් භික්ෂුනී උපසම්පදාවට දැඩිලෙස විරුද්ධ වූ එක් දසසිල් මාතාවක් පැවසුවේ තම මිතුරු දසසිල් මාතාවන් උපසම්පදාව ලැබු පසු තමන්ව ගණන් නොගෙන සිටි බවයි.

භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීමෙන් ඇතිවූ සමාජ හා ආගමික ධුරාවලියේ ව්‍යාකූලත්වය උපසම්පදාව යළි පිහිටවීම කෙරෙහි දසසිල් මාතාවන්ගේ විරෝධයට සුවිශේෂී හේතුවක් වෙයි. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලාංකික කාන්තාවන්ට 19 වන ශත වර්ෂයේ අගදී සෘජුවම භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීමට ඉඩ සලසා දුන්නේ නම් මෙම ව්‍යාකූලත්වය නැති කිරීමට ඉඩ තිබිණි! ලංකාවේ සහ අග්නිදිග ආසියාවේ කාන්තාවන්ට එක්වරම උපසම්පදාව ලැබීමට අවස්ථාව සලසා දුන්නේ නම් ඔවුන් විකල්ප දසසිල් නිකායන් නිර්මාණය කර නොගන්නට තිබිණි.

නමුත් අද තරුණියන් සහ කාන්තාවන් භික්ෂුනීන් වීමට වඩා දසසිල් මාතාවන් වීමට තීරණය කරන්නේ ඇයි? මා සිතන පරිදි එය පෞද්ගලික සම්බන්ධතා මත සිදුවන්නකි. නිදසුනක් ලෙස මම මෑතකදී අවුරුදු 64 දී ජීවිතයේ පළමුවරට පැවිදි වූ කාන්තාවක් සමග සම්මුඛ සාකච්ඡාවක් කළෙමි. ඇය මට පැවසුවේ ඇය පැවිදිවීම ගැන සලකා බලන විට භික්ෂුනියක වනවාද දසසිල් මාතාවක වනවාද යන්න පිළිබඳ ස්ථිර හැඟීමක් නොතිබුණු බවයි. නමුත් භික්ෂුනී ආරාමයකට සම්බන්ධව පැවති ඇඳුනුම්කම් මත එම ආරාමයේ ප්‍රධානියා වෙත ඇයව යොමු කෙරුණු අතර ඇය සාමණේරියක් වී භික්ෂුනියක් වූවාය. දසසිල් මාතාවක් වනවාද භික්ෂුනියක් වනවාද (කුමන විහාරයට සම්බන්ධ වනවාද) යන්න තෝරා ගැනීම නිතරම අහම්බයෙන් පෞද්ගලික සම්බන්ධතා මගින් තීරණය වේ.

මෑතකදී දසසිල් මාතාවක්ද උපසම්පදා වූ භික්ෂුනියක්ද යන්න තහවුරු කර ගැනීමට මා විසින් (සහ මගේ පර්යේෂණ සහකාරිය විසින්) නැවත නැවත දරන ලද උත්සාහයන්ට ප්‍රතිවිරෝධය පෑ මෙහෙණියක් සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වුයෙමි. (ඇයගේ සිවුරෙන්ද ඒ බව ප්‍රකට නොවීය.) ඇය අපට පැවසුවේ ශීලය ඇත්තේ සිවුරේ නොව පුද්ගලයා තුළ බවයි. උදාහරණ ලෙස දැඩි උණුසුම් දිනයක මා අසලින් වාඩිවී බසයේ ගමන්ගත් මෙහෙණිය පිළිබඳ සිතන්න. ඇය දසසිල් මාතාවක නමුත් ඇය, මට හමු වී ඇති භික්ෂුනියන් මෙන්ම එදින මට ආධ්‍යාත්මික සහායිකාවක් වූවාය. මම පෞද්ගලිකව ශ්‍රී ලංකාවේ (සහ වෙනත් ඕනෑම තැනක) භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීමට සහය

දැක්වූවත් මා තුළ ශ්‍රී ලාංකික දසසිල් මාතාවන් වැනි විකල්ප නිකායන්ට අයත් මෙහෙණින් වෙනුවෙන්ද ඉමහත් ගෞරවයක් ඇත.

## ශ්‍රී ලංකාවේ භික්ෂුනියන්ගේ නීතිමය තත්ත්වය

භික්ෂුනී උපසම්පදාව තවම ශ්‍රී ලංකා රජය මගින් නිල වශයෙන් පිළිගෙන නොමැත. ඒ සඳහා ඇතැම් ප්‍රධාන දේශපාලඥයින්ගේ හා භික්ෂූන්ගේ සහාය ලබා ගත යුතු වෙයි. දැනටමත් සඳහන් කර ඇති පරිදි භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීම ශ්‍රී ලංකාවේ මතභේදයට තුඩු දෙන තත්වයක පවතින්නේ හුදෙක් එයට මහායාන සම්බන්ධකම් ඇතැයි සමහරු සිතන නිසාම නොවේ. ආර්ථික, සමාජ හා දේශපාලන හේතු මත භික්ෂුනී උපසම්පදාව යළි පිහිටුවීමට එරෙහි පුද්ගයන් සිටිය හැකියි. එය සංකීර්ණ තත්ත්වයකි.

නිල පිළිගැනීම නොමැති වීමේ ආසන්නතම ප්‍රතිඵලය වනුයේ මූල්‍යමය ප්‍රතිපාදනයි. භික්ෂූහු සහ ඊට අඩු වශයෙන් දසසිල් මාතාවෝ ආණ්ඩුවෙන් මූල්‍යමය සහය ලබති. (ඇතැම් දසසිල් මාතාවන් උපසම්පදා වීමට මැලිවීමට මෙම මූල්‍යමය සහායද එක් හේතුවකි). උදාහරණයක් වශයෙන් රජය භික්ෂූන්ගේ සහ දසසිල් මාතාවන්ගේ පිරිවෙන් අධ්‍යාපනය සඳහා අරමුදල් සපයයි. නමුත් තවමත් මුළු රටේම සිටින සාමනේරිවරියන් සහ භික්ෂුනීන් උදෙසා එකදු රාජ්‍ය පිරිවෙන් අරමුදලක් නැත. ඇතැම් ගුරුවරු ඔවුන්ගේ සේවය නොමිලේ සැපයූවත් (එසේ කරන්නේ කිහිපදෙනෙකු පමණි.) භික්ෂුනී ආරාම එම ගුරුවරු උදෙසා ප්‍රවාහන වියදම් ගෙවිය යුතුය. මේ වියදම පමණක් වුවද භික්ෂුනී ආරාමවලට බරපතල දුෂ්කරතාවකි. භික්ෂුනීන්ට භික්ෂුනීන් ලෙස ජීවත් වීමට නීතිමය රාජ්‍ය පිළිගැනීම අවශ්‍ය නැත - කිසිවෙකුටත් ශ්‍රී ලංකාව තුළ ඔවුන්ව භික්ෂුනීන් ලෙස ජීවත් වීමෙන් වැළැක්විය නොහැකිය - නමුත් භික්ෂුනී උපසම්පදාවේ සාර්ථක වර්ධනය සක්‍රීය කිරීම සඳහා පිරිවෙන් පිහිටු වීමට මෙම නීතිමය පිළිගැනීම අත්‍යවශ්‍යය.

භික්ෂුනීහු රාජ්‍ය අනුග්‍රහය නොලැබුවත් ගිහි බෞද්ධයින්ගෙන් (සමහර රාජ්‍ය නිළධාරීන්ද ඇතුළුව) සහ බෞද්ධ භික්ෂූන්ගෙන් සැලකිය යුතු පෞද්ගලික අනුග්‍රහයක් ලබති. විශේෂයෙන්ම බොහෝ දෙනෙක් එවැනි උපසම්පදාවක් ඇති බව නොදන්නා නිසා සහ සත්‍ය වශයෙන්ම මෙම උපසම්පදාවේ අර්ථය පිළිබඳ ව්‍යාකූලත්වයට පත්ව සිටින නිසා භික්ෂුනී උපසම්පදාවට සහාය දක්වන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිශතය නිශ්චය කිරීමට අපහසුය. මේ වන විට භික්ෂුනීන් සඳහා දක්වන අනුග්‍රහය මිශ්‍ර වී ඇති බව මට කිව හැකිය. මා ගොස් ඇති භික්ෂුනී ආරාම ඔවුන්ගේ ගම්වැසියන් අතර ඉතා කීර්තියට පත්ව ඇත. මිනිසුන් භික්ෂුනීන් සමග ඍජු සබඳතා පවත්වන තරමට ඔවුන් සක්‍රියව සහ තිතැතින්ම භික්ෂුනීන්ට සහය දැක්වීමට පෙළඹෙන බව පෙනී යයි.

## භික්ෂුනීන්ට භික්ෂූන්ගේ අනුග්‍රහය

ශ්‍රී ලාංකික භික්ෂුවගේ සහය නොවන්නට භික්ෂුනී ශාසනයක් ලංකාවේ බිහිනොවන්නට ඉඩතිබිණි. 1996 සහ 1998 පුරෝගාමී ජාත්‍යන්තර උපසම්පදා උත්සව ශ්‍රී ලාංකික භික්ෂුවගේ සක්‍රීය සහභාගීත්වය නොමැතිව කිසිදා සිදුකළ නොහැකිය. තවදුරටත්, ශ්‍රී ලාංකික භික්ෂුවගේ අඛණ්ඩ

සක්‍රිය සහාය නොමැතිව භික්ෂුනී උපසම්පදාව මෙතරම් (භික්ෂුනීන් වහන්සේලා 1000කින් පමණ යුතුව) ශක්තිමත් වන්නේද නැත. භික්ෂුනී උපසම්පදා උත්සවයන්ට සහභාගී වීම, පොදුවේ සහ පුද්ගලිකව භික්ෂුනීන්ට මග පෙන්වීම් (භික්ෂුනී උපසම්පදාව සඳහා නිල රාජ්‍ය පිළිගැනීම ලබා ගැනීමට ඇතුළුව), භික්ෂුනීන් සඳහා දානමය පුණ්‍යෝත්සව පැවැත්වීම, භික්ෂුනීන් සඳහා ගුරුවරුන් සහ උපදේශකවරුන් ලෙස සේවය කිරීම සහ භික්ෂුනීන්ගේ පහසුකම් සඳහා ඉඩම් සහ ගොඩනැගිලි සැපයීම ආදියෙන් භික්ෂූහු භික්ෂුනීන්ට සහය දක්වති. භික්ෂූන් කෙතරම් භික්ෂුනීන්ට සහය දක්වන්නේද යන්න විස්තර කිරීමට මෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවේ. භික්ෂුනීන් නිරන්තරයෙන්ම මා සමග භික්ෂූන්ගේ සහයෝගයට කෘතඥතාව පළකර ඇත.

නමුත් භික්ෂු සහාය ඇත්ත වශයෙන්ම මිශ්‍ර වුවකි. ඇතැම් අවස්ථාවක මා ශ්‍රී ලංකාවේ භික්ෂුනීන් පිළිබඳ සමීක්ෂණයක් කරන බව දැන ගත්විට ශ්‍රී ලාංකික භික්ෂුනීන්ට තම විරුද්ධත්වය ප්‍රකාශ කළ භික්ෂුවක් නිසා මම කම්පාවට පත්වුයෙමි. උදාහරණයක් වශයෙන් එක් භික්ෂුවක් ශ්‍රී ලාංකික භික්ෂුනීන් මුදල් පමණක් තකන බව ප්‍රකාශ කළේය. කණගාටුවට කරුන නම් මම මෙම අදහස මීට පෙර කිහිප විටක්ම අසා තිබීමයි. මෙම අදහසට පදනම් වූ වැරදි තර්කය පහත පරිදි දැක්විය හැකිය. ¨ශ්‍රී ලාංකික භික්ෂුනීන් සත්‍ය වශයෙන්ම මහායාන භික්ෂුනීන්ය.¨ බොහෝ ශ්‍රී ලාංකිකයෝ මහායානය පිළිබඳව කිසිවක් නොදනිති. එසේත් නැත්නම් ඔවුන් එය 1) විදේශීය බුදු දහමක් වීම නිසා සහ/හෝ 2) මහායාන භික්ෂූන් හෝ මෙහෙණිවරු බ්‍රහමචර්යාව ආරක්ෂා නොකරන බවට විශ්වාස කරන නිසා (ජපානයේ සිටින විවාහක පූජකවරුන්ගේ ආදර්ශය සියලුම මහායාන පූජකවරුන් අනුගමනය කරන ධර්මයක් බවට වරදවා හිතාගෙන) ඔවුහු මහායාන බුදු දහම ප්‍රතික්ෂේප කරති. එමෙන්ම විදේශිකයන් පොහොසත් බව ශ්‍රී ලාංකිකයන් තුළ පවතින පොදු විශ්වාසයකි. එමනිසා ශ්‍රී ලංකා භික්ෂුනී උපසම්පදාවට විරුද්ධත්වය පළ කරන මෙම භික්ෂුව වැනි ඇතැමුන් විශ්වාස කරන්නේ මූලිකව ශ්‍රී ලාංකික දසසිල් මාතාවන් උපසම්පදාව ලබන්නේ ධනවත්වූ විදේශීය මහායාන මිතුරන්ගේ මුදල් ලබාගැනීම සඳහා බවයි.

භික්ෂුනී ආරාමයන්ගේ කටයුතුවලට හිතාමතාම බලපෑම් කරන භික්ෂූන් පිළිබඳව මටද දැනගන්නට ලැබී ඇත. උදාහරණයක් ලෙස එක් භික්ෂුවක් විසින් ගිහියන් බොහෝ දෙනෙකු පෝය වැඩසටහන් සඳහා තම භික්ෂු ආරාමයට එනවා වෙනුවට භික්ෂුනී ආරාමයට යෑමේ හේතුවෙන් පෝය වැඩසටහන් නවතන ලෙස භික්ෂුනී ආරාමයට දැනුම් දී තිබිණි. එක් උපාසිකාවක මට පැවසුයේ භික්ෂු ආරාමය වෙනුවට භික්ෂුනී ආරාමයට අනුග්‍රහය දැක්වීම නිසා තම භික්ෂු ආරාමයේ හාමුදුරුවන් සහ එහි ගිහි දායකයන් පවා තමාව දුෂ්කරතාවට පත් කළ බවයි.

මා පෙරද සඳහන් කළ පරිදි භික්ෂුනීන්ට අනුග්‍රහය දක්වන භික්ෂූන්ගේ ප්‍රතිශතය දැනගැනීම අසීරුය. ඉතා විශාල වශයෙන් ශ්‍රී ලාංකික සංඝයා භික්ෂුනීන්ට සහාය දක්වන බව පැවසීමෙන් සෑහිමකට පත්විය හැකි වූවත් එය ඒකමතික සහයක් නොවේ.

**භික්ෂුණීන් සඳහා ගිහි අනුග්‍රහය**

ශ්‍රී ලංකාවේ බොහෝ කාලයක් වාසය කළ විදේශීය භික්ෂුණියක් වරක් මා සමග ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවේ ගිහියන් භික්ෂුණී ශාසනයට අනුගහ්‍රය දක්වන්නේ නම්, කිසිවෙකුටත් අවම වශයෙන් භික්‍ෂූන්ටවත් ලංකාවේ භික්ෂුණී ශාසනය හෝ පරම්පරාව නැවැත්විය නොහැකි බවයි. ලංකාවේ භික්ෂුණීන්ට ශක්තිමත් ගිහි අනුග්‍රහයක් පවතින බව මම සතුටින් කියමි. ඇත්ත වශයෙන්ම සියලුම ගිහියන් භික්ෂුණීන්ට අනුග්‍රහය දක්වන්නේ නැත. නමුත් භික්ෂුණී ආරාමවලට යාමට අවස්ථාව ලබාගත් අය භික්ෂුණීන් පිළිබඳ ඉතා ඉහළින් කතා කරති.

භික්ෂුණීහු, දසසිල් මාතාවන් මෙන් ඔවුන්ගේ ප්‍රජාව වෙනුවෙන් පුළුල් ක්‍රියාකාරකම්වල නිරතව සිටිති. ළමයින් වෙනුවෙන් කෙරෙන ආගමික වැඩසටහන් හා ළමා අධ්‍යාපන වැඩසටහන්, සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්, දුප්පතුන් හා රොගීන්ගේ සුබසාධනය, මනෝවිද්‍යාත්මක උපදේශනය සහ භාවනා පන්ති, සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනා (ආරක්‍ෂක ධර්ම ග්‍රන්ථ/පිරිත්) මන්ත්‍ර ආගමික පුණ්‍යකර්ම සහ විවිධ වර්ගයේ දහම් ඉගැන්වීම් ආදී සියලුම වයස් මට්ටම්වලට ගැළපෙන ආගමික වැඩසටහන් මාලාවක් ඒ අතර වෙයි.

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ පන්සල්වලින් නිතිපතා සිදු නොවන භාවනා ඉගැන්වීම සඳහා භික්ෂුණීන්ට විශේෂ ඉල්ලුමක් ඇත. ගිහි දායිකාවන් කිහිප දෙනෙක්ම මට පවසා ඇත්තේ ඔවුන්ගේ ප්‍රදේශවල පන්සල් විසින් භාවනා වැඩසටහන් නොපවත්වන බැවින් ඔවුන් භික්ෂුණී ආරාමයට අනුග්‍රහය දක්වන බවයි. භික්‍ෂුණීන්ට භාවනා වැඩසටහන් පැවත්වීමට ඇති හැකියාව ගැන දන්නා භික්‍ෂූහු ඇතැම්විට ගිහියන් වෙනුවෙන් තම පන්සල්වල භාවනා වැඩසටහන් පැවැත්වීමට භික්ෂුණීන්ට ආරාධනා කරති.

භික්ෂුණීන් සහ ගමේ කුඩා දරුවන් අතර සිදුවන අන්තර් ක්‍රියාවන්ද මම විශේෂයෙන් සමීපව අධ්‍යයනය කළෙමි. අප ගිහි අනුග්‍රහය ගැන කතා කරන විට, වැඩිහිටියන් තනිව නොව මුළු පවුලම භික්ෂුණීන්ට සම්බන්ධ බව සිත්හි තබා ගත යුතුය. මගේ ප්‍රදේශයේ භික්ෂුණී ආරාමය ඔවුන්ගේ ආගමික වැඩසටහන්වල ප්‍රමුඛත්වය සහ කේන්ද්‍රස්ථානය දරුවන්ට ලබාදෙයි. උදාහරණ ලෙස එක් පෝය දිනයක කුඩා දරුවෝ අප ඉදිරියෙහි කතා පැවැත්වූහ; වයසින් වැඩි දරුවෝ කිහිපදෙනෙක් සර්වරාත්‍රික පිරිත් දේශනයකදී මෙහෙණින් සමග එක්ව පිරිත් කියූහ; ඔවුහු සියලු දෙනාම පන්සලේ පැවැත්වූ ලාංකික සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවයට දෙමාපියන් සමග පැමිණියහ. මෙම ආරාමයේ භික්ෂුණියක් තමන්ගේ මල්ලි කෙරෙහි පවතින ඊර්ෂ්‍යාව නිසා ගෙදරදී වැරදි කරන දරුවෙකුට සැළකිය යුතු ආකාරය පිලිබඳව වැඩිහිටියෙකුට උපදෙස් දෙනු මෑතකදී මම අසා සිටියෙමි. ඇයගේ අවවාදය වූයේ ඊර්ෂ්‍යා කරන දරුවාට බැනීම වෙනුවට බොහෝ සේ ආදරය කරන්න යන්නයි. තම දරුවන්ට මෘදුව සහ ඉවසීමෙන් සලකන ලෙස භික්ෂුණීන් දෙමාපියන්ට අවවාද කරනු මම බොහෝ විට අසා ඇත්තෙමි. ඊට අමතරව, වැඩිහිටියන්ට මෙන්ම දරුවන්ටද ගෙදරදී මෛත්‍රී භාවනාව කිරීමට උපදෙස් දෙමින් ධර්මය පවුල් ජීවිතයට උදව්කරගත හැකි ආකාරය කියාදෙන සැටි මම අසා ඇත්තෙමි.

භික්ෂුණී ආරාමවල දක්නට නොලැබෙන ලංකාවේ ව්‍යාප්තව පවත්නා තවත් එක් ආගමික චාරිත්‍රයක් වන්නේ විභාග සමත්වීම, දරුවන් ලැබීම හෝ ලෙඩ සුවවීම වැනි ලෞකික දේ වෙනුවෙන් දෙවියන් යැදීමයි. භික්ෂු පන්සල්වල දේවාල හෝ දෙවස්ථාන තිබෙන නමුත් භික්ෂුණී ආරාමවල ඒවා දක්නට නොලැබෙන තරම්ය.

ගිහි දායකයන් බොහෝවිට සාමණේරවරියන් හා භික්ෂුණීන් හඳුන්වන්නට යොදන ගුණනාම වන්නේ කරුණාවන්ත හා සිල්වත් යන්නයි. විශේෂයෙන් ගිහි උපාසිකාවෝ පවුල් ප්‍රශ්නයකදී උපදෙස් පැතීමේදී හෝ ඇතැම් ධර්ම කරුණු අසා දැන ගැනීමේදී මෙහෙණිවරුන්ට ඒවෙත කොතරම් හොඳින් ප්‍රවේශ විය හැකිද යන්න අවධාරණය කරයි. ඇත්ත වශයෙන්ම උපාසිකාවන් මා සමග කිහිප වතාවක්ම පවසා ඇත්තේ මෙවැනි ප්‍රශ්න පිළිබඳ භික්ෂූන් සමග කතා කරනවාට වඩා වැඩි පහසුවක් භික්ෂුණීන් සමග කතා කරනවිට ඇති බවයි. ඒ ඇයි? භික්ෂූන්ට මෙන්ම මෙහෙණිවරුන්ටද විරුද්ධ ලිංගිකයන් සමග වැඩිපුර ආශ්‍රය කළ නොහැකි බව ඔවුන් දන්නා නිසයි. එමෙන්ම ඇතැම්විට භික්ෂූන්ට ලංකාවේ හිමි ඉහළ සමාජ හා ආගමික තත්ත්වය නිසා ඔවුන් විසින් බලපෑම් කිරීමටද ඉඩ ඇති බව ඔවුහු සිතති. එක් උපාසිකාවක් පැවසූ පරිදි, "පන්සලේ ඉතින් හාමුදුරුවොත් එක්ක ගැවසෙන කොට අපට ළඟින් ඉන්න බෑනෙ. මෙහෙනින් වහන්සෙලත් එක්ක මෙහෙම එකට ඉඳගෙන ප්‍රශ්න අහන්න පුළුවන්, කතාකරන්න පුළුවන්. ඕනෙ දෙයක් මෙහෙනින් වහන්සේලාත් එක්ක (කතාකරන්න පුළුවන්.)… ඕන දෙයක් අහන්න පුළුවන්… හාමුදුරුවන්ගෙන් අහන්න බැරිදේවලුත් මෙහෙනින් වහන්සේලාගෙන් අහන්න පුළුවන්. භාවනා කරන කොට උනත් (අපිට භාවනාව ගැන හාමුදුරුවන්ගෙන්) අහන්න පුළුවන්. ඒ උනාට වැඩිය කිට්ටුවටම අපි යන්නෑනෙ… මෙහෙනින් වහන්සේගෙන් අපට තේරෙන්නැත්තම් කීප සැරයක් හරි අහන්න පුළුවන්නෙ. හාමුදුරුවන්ගෙන් එච්චර අහන්න යන්නෑනෙ."

ඇය භික්ෂුවගෙන් භාවනාව පිළිබඳ ප්‍රශ්න නැගීමට මැලි වන්නේ ඇයට ඒවා දුරින් සිට ඇසීමට සිදුවන නිසා සහ පිළිතුර තේරුම් ගැනීමට අපොහොසත් වුවහොත් නැවත ඇසීමට ඇති බිය නිසාය.

කුඩා භික්ෂුණීන් පවා තමන් සමාදන්වූ 311ක් වූ පැවිදි ශික්ෂාපද කෙරෙහි සුපරීක්ෂාකාරී වන නිසා භික්ෂුණීන් සම්බන්ධයෙන් මට විශේෂයෙන් නැවත නැවතත් අසන්නට ලැබුණු 'සිල්වත්' යන නාම විශේෂණයේ පුදුමයක් නැත. සැලකිය යුතු ගිහියන් පිරිසක් මා හට විශ්වාසයෙන් යුතුව පැවසුවේ භික්ෂුණීන් භික්ෂූන්ට වඩා සිල්වත් බවයි. උදාහරණයක් ලෙස, ගිහි බෞද්ධයන් පවසන පරිදි ඔවුන් දන් දෙන විට සමහර අවස්ථාවලදී භික්ෂූන් වහන්සේලා මස් මාංශ ඉල්ලා සිටින අතර භික්ෂුණීන් කිසිදා එසේ කරන්නේ නැත. තවද සමහර භික්ෂූන් වහන්සේලා වුවමනා තරමටත් වඩා විවිධ නවීන උපකරණාදිය භාවිත කරන බවට ගිහියෝ චෝදනා කරති. උදාහරණ ලෙස සමහර භික්ෂූහු විසිතුරු ඉලෙක්ට්‍රොනික් උපාංග භාවිත කරන අතර කලාතුරකින් සමහර භික්ෂුවක් තමන්ගේම කාරයක් හෝ වාහනයක් අයිතිව සිටිති. භික්ෂුණීන් තරමක් දුප්පත් හෙයින් ඔවුන් සම්බන්ධයෙන් මෙබඳු ගැටලුවක් පැනනොනගී.

ඇත්ත වශයෙන්ම ලංකාවේ සිල්වත් භික්ෂූහු බොහෝ සිටිති. කෙසේ වෙතත් මෙහිදී මා කීමට උත්සාහ ගන්නේ භික්ෂුනීන් ඔවුන්ගේ උසස් සිල්වත් බව සම්බන්ධයෙන් නිරන්තරයෙන් ප්‍රශංසා ලබන බවයි. තවද ශ්‍රී ලංකාවේ භික්ෂුනී උපසම්පදාව පිළිබඳ අර්බුදයේ උත්ප්‍රාසාත්මක කරුණ වන්නේ භික්ෂුනී ශාසනයට පක්ෂ විපක්ෂ දෙපිරිසම ථෙරවාද බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය තකා එසේ පක්ෂ හෝ විරුද්ධ වීමයි. උපසම්පදාව යළි පිහිටුවීමට විරුද්ධ අය විශ්වාස කරන්නේ ශ්‍රී ලාංකික භික්ෂුනී උපසම්පදාවට ඇතැයි සමහරු සිතන මහායාන සම්බන්ධය නිසා ථේරවාද බුදු දහමේ නිර්මලත්වය තර්ජනයට ලක්ව ඇති බවයි. උපසම්පදාවට පක්ෂ අය විශ්වාස කරන්නේ භික්ෂුනීන් සිල්වත් නිසා එමගින් ථෙරවාද බුදු දහමේ නිර්මලත්වය සහතික කරන බවය. එම නිසා සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකික භික්ෂුනීන් ථේරවාද ශාසනයේ ආධ්‍යාත්මික මිතුරන් යැයි විශ්වාස කරන මා වැනි අනුග්‍රාහකයෝ (ඔවුන්ට සහය දෙන භික්ෂූන් වහන්සේලාද ඇතුළුව) බොහෝ සිටිති.

---

1 Phra Prayudh Payutto, *Buddhadhamma: Natural Laws and Values for Life*, trans. Grant A. Olson (Albany: State University of New York Press, 1995), 224-225.

2 මවිසින් ලියන ලද *Virtuous Bodies: The Physical Dimensions of Morality in Buddhist Ethics* (Oxford University Press, 2007) කියවන්න.

3 මානෙල්වතු විහාරයේ පූජ්‍ය චන්දිම හිමි ශ්‍රී ලංකාවේ භික්ෂුනීන්ගේ හා සාමණේරියන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම ආරම්භ කර තිබුණද ලංකාවේ මෙවැනි නිල ලේඛනයක් නොමැත. ලියාපදිංචි වූ දසසිල් මාතාවන්ගේ නිලමය ලේඛනයක් තිබිය යුතු වුවත් මෙම ලිපිය මුද්‍රණය සඳහා යැවූ නිසා මට එය ලබාගත නොහැකිවිය. තවදුරටත් මගේ ශිෂ්‍ය ගිහානි ද සිල්වා මතක් කර දුන් පරිදි බොහෝ දසසිල් මාතාවන් ඔවුන්ගේ ජාතික හෝ ප්‍රාදේශීය සංවිධානවල ලියාපදිංචි වී නොමැත. "Discourse and Counter-discourse(s) on the New Bhikkhuni Order in Sri Lanka: An Ethnographical Inquiry," *Nivedini* 15 (Nov.-Dec. 2009): 28. හි ප්‍රේමකුමාර ද සිල්වා දසසිල් මාතාවන් 3,500 ක් සිටින බව දක්වා ඇත. සියලුම දත්ත වෙනස්වන සුළු බැවින් නිශ්චිත සංඛ්‍යාව කිව නොහැකිය. මෙම දත්ත ලබා දීම පිළිබඳව මගේ පර්යේෂණ සහකාරිය චමිලා සොමිරත්නට ස්තූතිවන්ත වෙමි.

4 Bhikkhu Bodhi, "The Revival of the Bhikkhuni Ordination in the Theravada Tradition," in *Dignity and Discipline: Reviving Full Ordination for Buddhist Nuns*, ed. Thea Mohr and Jampa Tsedroen (Boston: Wisdom Publications, 2010),99-142. 2011 අප්‍රේල් 17 වන දින බදු සරණ පත්‍රයේ (පි:5) සහ අප්‍රේල් 25 වන දින (පි:4) හි පළ වූ "Celebrating the Revival of the Bhikkhuni Order," නම් ලිපියෙන් මා විසින්ද බෝධි හිමිගේ අදහස් කිහිපයක් සංක්ෂිප්තව දක්වා ඇත. බුදු සරණ පත්‍රයේ කර්තෘවරු මගේ මුල් ලිපියෙහි මාතෘකාව සංස්කරණය කර ඇති බව සලකන්න. මාතෘකාව විය යුත්තේ "Celebrating the Revival of the Buddha's Fourfold Sangha." යන්නයි. කර්තෘවරු අනුමාතෘකාද එක් කර ඇත. එහි, "Tibetan Buddhism" ලෙස යොදා ඇති මතෘකාව "Mahayana Buddhism." ලෙස නිවැරදි විය යුතුය. 2011 මැයි 24 වන දින බුදුසරණ පත්‍රයේ මෙම ලිපියේ සිංහල පරිවර්තනයක් පළ කර ඇතත් එම ලිපියේ සමහර තැන් මුල් ඉංග්‍රීසි ලිපියට වඩා වෙනස් අර්ථ සහිතව පරිවර්තනය වී ඇති බව කියවන්නන් සිහි තබාගන්න.